INSTITUTE FOR HEALTH POLICY

**72,** පාර්ක් වීදිය, කොළඹ**-2,** ශ්‍රී ලංකාව
දු.ක**:** +94 11 231 4041/2/3/5 ෆැක්ස්**:** +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk  වෙබ්: www.ihp.lk  ට්විටර්: @ihplk

මාධ්‍ය නිවේදනය

**නිකුත් කිරීම**

දිනය: 2024 ඔක්තෝබර් 24
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව.10.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk  ට්විටර්: @ravirannaneliya


# ජනපතිවරණයෙන් පසුව සැප්තැම්බර් මාසයේ දී, ශ්‍රී ලාංකිකයින්ගෙන් 41%ක් රට නිවැරදි දිශාවට ගමන් කරන බව පවසයි

## *ජනපතිවරණය රට ගමන් කරන දිශානතිය සම්බන්ධයෙන් පොදු ජනතාවගේ මතය විශාල ලෙස වෙනස් කිරීමට සමත්ව ඇත*

2024 සැප්තැම්බරයේ SLOTS මත විමසුම්වලට අනුව, රටේ දිශානතිය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයින්ගේ මතය කැපී පෙනෙන ලෙස වැඩි දියුණු වී ඇත. ජනපතිවරණයට පෙර අවසාන සති කිහිපය තුළ, මහජනතාවගෙන් 43%ක ශුද්ධ අගයක් රට වැරදි දිශාවට ගමන් කරන බව විශ්වාසකර ඇත. මේ තත්ත්වය ජනපතිවරණයෙන් පසු ප්‍රතිවර්තනය වී, 5%ක ශුද්ධ අගයක ශ්‍රී ලාංකිකයින් රට නිවැරදි දිශාවට ගමන් කරනබව මාසයේ අවසන් දින දහයේ දී ප්‍රකාශ කර තිබේ. මෙය 2022 අප්‍රේල් මාසයේ දී SLOTS විසින් මේ සම්බන්ධ සමීක්ෂණ ඇරඹීමෙන් පසු පෙන්නුම් කළ ඉහළම අගය යි.

සමස්ථයක් ලෙස සැප්තැම්බර් මාසයේ දී, වැඩිහිටි ජනතාවගෙන් 21%ක සාමාන්‍යයක් රට නිවැරදි දිශාවට ගමන් කරනබව ප්‍රකාශ කර ඇති අතර, සැප්තැම්බර් මස 21ට පෙර ඔවුන්ගෙන් 54% ක් දෙනා රට වැරදි දිශාවට ගමන් කරනබවට විශ්වාස කර තිබේ. සැප්තැම්බර් මස 21 ජනපතිවරණයට පෙර සමයේ දී, 16%ක් දෙනා රට නිවැරදි දිශාවට ගමන් කරනබවට විශ්වාස කර ඇති අතර, ජනපතිවරණයෙන් පසු එය 41% දක්වා වැඩිවී ඇත. ජනපතිවරණයට පෙර 59%ක් දෙනා රට වැරදි දිශාවට ගමන් කරනබවට විශ්වාස කර ඇති අතර, ජනපතිවරණයෙන් පසු එය 36%ක් දක්වා පහළ වැටී ඇත.

ජනමතයේ මෙම කැපී පෙනෙන වෙනස ඇතිවී ඇත්තේ සැප්තැම්බර් 21 ජනපතිවරණය අවසන් වූ විගස ය. SLOTS විසින් සැප්තැම්බර් 22-23 මත විමසුම් සිදු නොකළ අතර, සැප්තැම්බර් 24 නැවත මත විමසුම් ආරම්භ කළ විගස මේ ආකල්පමය වෙනස පැහැදිලිවම හඳුනාගත හැකි තත්ත්වයක පැවතිණි.




රටේ දිශානතිය සම්බධයෙන් මහජන මතයේ සිදුව ඇති වෙනස සියලු ජනවිකාසයන් හරහා පුළුල් පරාසයක විහිදී ඇත. විශාලතම වෙනස දකින්නට ඇත්තේ දරිද්‍රතම වැඩිහිටියන් (+77%) සහ තරුණ වැඩිහිටියන් (අවු.18-29 +74%, අවු. 30-44 +77%), සිංහල (+75%) සහ මුස්ලිම් (+74%) ප්‍රතිචාර දැක්වූවන් අතර ය. සමස්ථයක් ලෙස රටේ දිශානතිය සම්බන්ධ ආකල්ප ධන පරාසයට ගමන්කර නොමැති ජන කොටස වනුයේ ධනවත්ම තුනෙන් එකක ශ්‍රී ලාංකිකයින් ය. ඔවුන්ගෙන් 6%ක් රට වැරදි දිශාවට ගමන කරන බවට විශ්වාස කර තිබේ.

මේ විශාල මතවාදී වෙනසත් සමග, ශ්‍රී ලාංකිකයින්, ජනපතිවරණයට පෙර සිය රට ගමන් කරන දිශාව සම්බන්ධයෙන් අසුබවාදී ආකල්ප දැරූ ජාතියක සිට වඩාත් ධනාත්මක ආකල්ප දරන ජාතියක්බවට පත්ව ඇත. 2024 සැප්තැම්බර් මාසයට පෙර, 'නොදනියි' ප්‍රතිචාර ඉවත් කළ පසු, සෙසු රටවලට සාපේක්ෂව ශ්‍රී ලාංකිකයින්ගෙන් 90%කට වඩා රට වැරදි මාර්ගයේ යනබවට විශ්වාස කර ඇත. රටවල් 29ක සහභාගීත්වයෙන් සිදු කරන ලද ජගත් IPSOS මත විමසුමක දී, සැප්තැම්බර් මස ඇස්තමේන්තුගත කිරීම්වලට අනුව 61%ක ජනතාවක් සිය රට වැරදි දිශාවට ගමන් කරන බව ප්‍රකාශකර ඇති අතර, සංසන්දනාත්මක ලෙස, ජනපතිවරණයට පෙර 79%ක ශ්‍රී ලාංකික වැඩිහිටියන් මේ මතය දරා ඇත. මේ අගය සුබවාදී මට්ටමක පැවතියේ දකුණු කොරියාව සහ ජපානයට සාපේක්ෂව පමණක් වන අතර, මත විමසුම්වලට බඳුන් කරන ලද වෙනත් සියලු දකුණු ආසියාතික රටවල්වලට වඩා පසුපසින් ස්ථානගතව පැවතියේ ය. ජනපතිවරණයෙන් පසු මේ අගය 32%ක් දක්වා පහළ වැටී ඇති අතර (68%ක් නිවැරදි දිශාවට ගමන් කරන බව ප්‍රකාශකර ඇත), ඒ අනුව ශ්‍රී ලංකාව වඩාත් ධනාත්මක ආකල්ප දරන රටවල් ත්‍රිත්වය අතරට පැමිණ ඇත.

**වැඩි විස්තර ihp.lk වෙතින් ලබා ගත හැකිය**

Institute for Health Policy, October 2024, “41% of Sri Lankans say the country is heading in the right direction in September after the Presidential Election”. *Available at:* https://ihp.lk/research-updates/41-sri-lankans-say-country-heading-right-direction-september-after-presidential

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

මෙම සමීක්ෂණය සැලසුම් කිරීම සහ පැවරීම සඳහා IHP මුළුමනින්ම වගකිව යුතු අතර, එහි පූර්ණ වගකීම දරයි. IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTSහි ප්‍රධාන විමර්ශක වන IHPහි ආචාර්ය රවී රන්නන්-එළිය, හාවඩ් විශ්වවිද්‍යාලයයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර, දශක තුනක් පුරා ලංකාව තුළ හා ලංකාවෙන් පිටත විවිධ මත විමසුම් සමීක්ෂණ සිදුකර තිබේ.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹුව තෝරා ගැනීමකින් බඳවාගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියක්, SLOTS මඟින් සමීක්ෂණයට ලක් කරනු ලබයි. SLOTS මඟින් ප්‍රසිද්ධ චරිතයක් හෝ ආයතනයක් පිළිබඳ හිතකර හෝ අහිතකර මතයක් තිබේදැ යි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීම තුළින් හිතකරත්වය නිරීක්ෂණය කරනු ලබයි: සමස්ත හිතකරත්වය යනු ධනාත්මක (+100) සහ ඍණාත්මක (-100) ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අංශය, පළාත සහ පසුගිය ඡන්ද මනාපය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

IHP විසින් සෞඛ්‍ය සහ සමාජ තත්ත්වයන් සහ රටේ මහජන මතයේ වෙනස්කම් නිරීක්ෂණය කිරීම සඳහා SLOTS සමීක්ෂණය පවත්වනු ලබයි. සමීක්ෂණ මාතෘකා නිර්මාණය, පැවරීම සහ සැලසුම් කිරීම සඳහා IHP මුළුමනින්ම වගකිව යුතු අතර, එහි සම්පූර්ණ වගකීම දරයි. ජාතික ක්ෂේත්‍ර සමීක්ෂණයකින් හෝ අහඹු ලෙස දුරකථන අංක ඇමතීමෙන් ප්‍රතිචාර දක්වන්නන් බඳවා ගැනෙන අතර, IHP කාර්යය මණ්ඩලය විසින් දිනපතා සම්මුඛ පරීක්ෂණ සිදු කරනු ලැබේ. දෙදහස් විසි එක වර්ෂයේ සිට SLOTS ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රාහකයින් පරාසයක් සහාය දක්වා ඇති අතර, ඔවුන් අධ්‍යයනය සැලසුම් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හෝ වාර්තා කිරීමේ දී කිසිදු කාර්යයභාරයක් ඉටු නොකරයි. නීලන් තිරුචෙල්වම් භාරය, ආසියා පදනම, යුරෝපා කොමිසම, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ඕපන් සොසයටි ෆවුන්ඩේෂන් ආයතනය සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයා ඇත. වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සැපයෙන්නේ වීලුකස් ස්ටිෆ්ටුන්ග් පදනම, අබුඩාබියේ නිව්යෝක් විශ්වවිද්‍යාලයය, USAID සහ IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල විසිනි. තව ද, සමීක්ෂණ සොයාගැනීම් අවශ්‍යයෙන්ම අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධකර ගත හැකි ය.